# ඇටර්නි බලපත්‍රය

## අංකය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ................දරණ ස්ථානයේ පදිංචි .................. ජා.හැ.අං............දරණ මම 2013........ දින විදේශගත වීමට බලාපොරොත්තු වන බැවින් ශ්‍රී ලංකාව තුල මාගේ නමින් හා මගේ ක්‍රියාවන් නියෝජනය කිරීම සඳහා සුදුසුකම් ඇති අයෙකු නිත්‍යානුකූලව පත්කිරීමට අවශ්‍යව ඇත. එසේ හෙයින් සියළු දෙනා මෙයින් දැනගත යුතුය.

ඉහත කී ඇටර්නි අධිපති .....................වන මම ( ...................... දරණ ස්ථානයේ පදිංචි මාගේ ස්වාමි පුරුෂයා / බිරිද / මව / පියා/ වෙනත් වන (................) ජා.හැ.අං................යන අයට පහත සඳහන් කරනු ලබන සියළුම කාර්යයන් මා නමින් හා මා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් මෙයින් පත්කර ස්ථිර කර බලය පවරා ඇත. එකී කාරණා කවරේද යත්,

1) මා නමින් හා මා වෙනුවෙන් ..............සමෘද්ධි බැංකු සංගමයෙන් ............දින ලබා ගන්නා ලද රු...............ණය මුදල හා ඊට අදාල පොළිය වාරික 60 කින් ගෙවා නිම කිරීමට ඇති බැවින් එකී කාර්යයන් කිරීම සඳහා මගේ ඇටර්නි බලකරුට බලය පවරමි.
2) මා නමින් මා වෙනුවෙන්........... සමෘද්ධි බැංකු සංගමයේ .........අංක දරණ සාමාජික තැන්පත් ගිණුමට බැර කර ඇති රු 300000/-ක මුදල කොටස් වශයෙන් ලබාගෙන එකී මුදලින් ගොඩගැනීමට යෝජිත නව නිවස සඳහා සැලසුම් සකස් කිරීම, ඉදිකිරීම, ඉදිකරවා ගැනීම , ඊට අවශ්‍ය ප්‍රාදේශීය සභා / පලාත් සභා අනුමැතිය ලබාගැනීම ආදී සියළුම කටයුතු මා නමින් හා මා වෙනුවෙන් සිදුකිරීම සඳහා මාගේ ඇටර්නි බලකරුට බලය පවරමි.
3) ඉහත කී ණය මුදල හා නිවස ඉදිකිරීම සම්බන්ධව සියළුම ලිපි ලේඛණ අත්සන් කිරීම , ලිපි ලේඛණ ඉදිරිපත් කිරීම භාරගැනීම හා මාගේ දේපල සම්බන්ධයෙන් ආරවුල් විසදීමට නඩු කටයුතු පවත්වාගෙන යාම මා වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම, අධිකරණයෙන් නඩු නියෝග ලබාගැනීමට හා අභියාචනා කිරීම සඳහා මාගේ ඇටර්නි බලකරුට බලය පවරමි.
4) ඉහත කී ණය මුදල යම් විදිහකින් ගෙවා නිමකිරීමට නොහැකි වුවහොත් එම ණය මුදල සඳහා ඇපයක් ලෙස තබා ඇති නිශ්චල දේපොල සම්බන්ධයෙන් ණය හිමිට මනාපයක් කරගැනීම පිණිස බලය ලබාදීම සඳහා මාගේ ඇටර්නි බලකරුට බලය පවරමි.

ඉහත කී ඇටර්නි බලපත්‍රය මාගේ මරණය හෝ නීත්‍යානුකූලව අවලංගු කර දැන්වීම කරන තුරු වලංගුව පවතින අතර, මෙම ඇටර්නි බලපත්‍රය වලංගුව පවතින කාලය තුලදී ඇටර්නි බලකරු විසින් නීත්‍යානුකූලව කරනු ලබන සියළුම ක්‍රියාවන් හා කටයුතු මා විසින් අනුමත කර ස්ථිර කරන අතර, එකී සෑම කටයුත්තක්ම මා වෙනුවෙන් කිරීමට නීත්‍යානුකූල බලය විශේෂයෙන් පවරා දුන් බව තවදුරටත් ප්‍රකාශ කරමි.

ඉහත සදහන් ඇටර්නි බලපත්‍ර හිමිකරු වන මම සහ ඇටර්නි බලකරු වන අපි මෙයටත් මේ හා සමාන වාසගම් හා දිනයන් දරණ තවත් ලේඛණ දෙකකටත් ..................දින සහ (.........................) දින අත්සන් තැබුවෙමි.

සාක්ෂි

මීට සාක්ෂිකාරයන් වන අප ඉහතඇටර්නි හිමිකරුගේ අත්සන් අත්සන් කල අය හොදාකාරව හදුනන

බවද, ඔවුන්ගේ සම්පූර්න නම

රක්ෂාවන් සහ පදිංචි ස්ථාන

ඇටර්නි බලකරුගේ අත්සන

හොදින් දන්නා බවද

සැබැකොට සහතික කරමි.

1)

2)

සැ.යු:- මෙම ඇටර්නි බලපත්‍රය ණය හිමියා රැකියාවේ නිරත වන විදේශ රටට අදාල ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපති හෝ බලයලත් නිලධාරියකු විසින් තම මුද්‍රාව තබා සහතික කළ යුතුය.